සැ. යු. - 2021.06.04 දින පළ වූ අංක 2231 දරන *ගැසට් පත්‍රයේ* III, IV(අ), IV(ආ) කොටස් පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,232 - 2021 ජුනි මස 11 වැනි සිකුරාදා - 2021.06.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | - |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1330 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජූලි මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජුනි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*“යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.”*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1327 - B 82238— 5,403 (2021/06)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

## කුසලතා මත ග්‍රාම නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2021

## Competitive Examination for the Promotion to Supra Grade of Grama Niladhari on Merit Basis 2021

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ග්‍රාම නිලධාරී සේවයට අයත් පහත 5 වන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ග්‍රාම නිලධාරීන් එම සේවයේ අධි ශ්‍රේණියට කුසලතා මත උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ විභාගය 2021 සැප්තැම්බර් මාසයේදී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර මධ්‍යස්ථාන සහ මධ්‍යස්ථාන අංක සඳහන් ලැයිස්තුව, උපලේඛන අංක 01 වශයෙන් ද, දිස්ත්‍රික් අංක ලැයිස්තුව, උපලේඛන අංක 02 වශයෙන් ද, මෙම නිවේදනය අවසානයේ අමුණා ඇත.

*උසස් කිරීමේ නියමයන්.*-ලිඛිත තරග විභාගයෙහි ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව පදනම් කරගෙන ගණනය කරනු ලබන ලකුණුවල එකතුවෙහි අනුපිළිවෙළ අනුව කුසලතා පදනමින් පිරවිය යුතු පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරෙහි පුරප්පාඩු 71ක් සඳහා බඳවා ගනු ලැබේ.

02. *උසස් කිරීමේ ක්‍රමය* :

(i) මේ සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයක් පවත්වනු ලබන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල මත ලබන ලකුණු හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව පදනම් කරගෙන ගණනය කරනු ලබන ලකුණුවල එකතුවේ අනුපිළිවෙළ අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ.

(ii) ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයකින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක අයදුම්කරුවන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා සුදුසුකම් ලබයි.

(iii) අධි ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමේදී පළමුව පවත්නා පුරප්පාඩු වලට ස්ථාන මාරුවීම් මගින් දැනට සිටින නිලධාරීන්ට ස්ථාන මාරුවීමට අවස්ථාව ලබා දෙන අතර, එම ස්ථාන මාරු ලබා දීමෙන් පසු දිස්ත්‍රික්කය තුළ ඉතිරිවන පුරප්පාඩු වලින් 60% සඳහා විභාගයේදී ලබන ජ්‍යෙෂ්ඨත්වය මත සේවයේ යෙදී සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බැහැර, දිස්ත්‍රික්කය තුළ වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අනුයුක්ත කරන අතර, දිස්ත්‍රික්කය තුළ පවත්නා එම පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක් සුදුසුකම් ලබා ඇති අවස්ථාවන්හිදී, එම අය දිස්ත්‍රික්කයෙන් පිටත පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කරනු ඇත. එසේ අනුයුක්ත කරනු ලබන ස්ථානවල පත්වීම් භාර නොගන්නා අයගේ පත්වීම් අවලංගු කරන අතර, එවැනි අයකුට පසු අවස්ථාවකදී එම පත්වීම් සඳහා මෙම විභාගයේ ප්‍රතිඵල මත නැවත ඉල්ලීමක් කිරීමට හිමිකම් නොලබනු ඇත.

(iv) මෙම විභාගය පවත්වනු ලබන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් වන අතර, ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

03. (i) *විභාග පටිපාටිය.*- අයදුම්කරුවන් අභියෝග්‍යතාව හා විෂයානුබද්ධ අධ්‍යයනය යන විෂයයට පෙනී සිටිය යුතුය. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 01 1/2 ක් වන අතර, සුදුසුකම් ලැබීමට අවම වශයෙන් මුළු ලකුණු 100න් 40ක් ලබාගත යුතු ය.

(ii) *විෂයය නිර්දේශය* :

කාර්යාල පරිපාලනයට හා ග්‍රාම නිලධාරීන්ට පැවරී ඇති රාජකාරි විෂයන්ට සම්බන්ධ කටයුතු ඉටුකිරීමේදී අවශ්‍ය වන සාමාන්‍ය දැනීම, තීරණ ගැනීමේ හැකියාව, තාර්කික විසඳීම හා කාර්යාල පරිපාලනය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.

04. *ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව මැනීම සඳහා ලකුණු ලබාදීමේ ක්ෂේත්‍ර* :

(i) ජ්‍යෙෂ්ඨත්වය — උපරිම ලකුණු 60
(රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු පිරිනැමේ)

(ii) *කුසලතාවය* (1 වන ශ්‍රේණියට පත්වීමෙන් පසු) — උපරිම ලකුණු 35

(ii-i) ලබා ඇති කීර්ති ප්‍රශංසා සඳහා — උපරිම ලකුණු 15
පොදු ආකෘති 230බී, මගින් ලබාදී ඇති කීර්ති ප්‍රශංසා, එක් සහතිකයක් සඳහා ලකුණු 03 බැගින් හා පොදු 230 බී ආකෘතියෙන් බැහැරව ලබාදී ඇති කීර්ති ප්‍රශංසා, එක් සහතිකයක් සඳහා ලකුණු 01 බැගින්

(ii-ii) *ග්‍රාම නිලධාරී කාර්යාල කළමනාකරණ තරගයෙන් ලද ජයග්‍රහණ සඳහා — උපරිම ලකුණු 20*

- සමස්ත ලංකා පළමු ස්ථානය — ලකුණු 15
- සමස්ත ලංකා දෙවන ස්ථානය — ලකුණු 12
- සමස්ත ලංකා තෙවන ස්ථානය — ලකුණු 10
- දිස්ත්‍රික් තරගයේ පළමු ස්ථානය — ලකුණු 08

- දිස්ත්‍රික් තරගයේ දෙවන ස්ථානය ලකුණු 06
- දිස්ත්‍රික් තරගයේ තෙවන ස්ථානය ලකුණු 04
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පළමු ස්ථානය ලකුණු 03
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙවන ස්ථානය ලකුණු 02
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෙවන ස්ථානය ලකුණු 01

(එක් වර්ෂයකදී එක් එක් මට්ටමෙන් ලබා ඇති ජයග්‍රහණ අතුරින්, ඉහළම ජයග්‍රහණය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

(iii) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව උපරිම ලකුණු 05

05. *සුදුසුකම්* : අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අපේක්ෂකයින් පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණකර තිබිය යුතුය.

(i) ග්‍රාම නිලධාරි 1 වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම සහ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත්වී තිබීම හෝ එම කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016 යටතේ සහන කාලයක් ලැබීමට හිමිකම තිබීම.

(ii) අවසාන වසර 05 හි වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

06. *වැටුප් ක්‍රමය* :

(i) *වැටුප් කේත අංකය* : MN 7-2016 (රු. 41,580-11 x 755-18 x 1,030 - රු. 68,425)- 2 වැනි පියවර

(මෙම වැටුප් පරිමාණය අනුව වැටුප් සකස් කිරීමේදී 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අදාළ වේ.)

(ii) I වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර නැති නිලධාරීන්ට එය සමත්වීමට විශේෂ ශ්‍රේණියට උසස් වූ දිනයේ සිට වසරක සහන කාලයක් ලබා දේ.

07. *අයදුම්පත් භාර ගැනීම* :

(i) මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. අයදුම්පත සකස් කිරීමේදී, ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. අයදුම්පත් A4 කඩදාසියක දෙපැත්ත භාවිතයට ගනිමින් පිළියෙල කළ යුතුය. අංක 01 සිට 05 දක්වා එහි මුල් පිටුවේ ද, ඉතිරි කොටස් ඉතිරි පිටුවල ද සකස් කළ යුතුය. අයදුම්පත් පරිගණකයක ආධාරයෙන් පිළියෙල කරගත හැකි නමුදු අයදුම්කරුවන් තමන්ගේම අත් අකුරින් මෙහි දැක්වෙන උපදෙස් පරිදි නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය.

(ii) අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කළ යුතුය. එක පිටපතක් තමාගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ද, අනෙක් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ද එවිය යුතුය.

(iii) සියලුම විභාග අපේක්ෂකයින් තම අයදුම්පත් තමා සේවය කරන වසම අයත් ප්‍රාදේශීය ලේකම් මගින්, විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2021 ජූලි මස 12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

(iv) අයදුම්පත එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ ''කුසලතා මත ග්‍රාම නිලධාරි අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2021'' යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

(v) අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය. එසේකුදු වුවත් තමන් සඳහන් කරන, එමෙන්ම තමන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි ඉල්ලූ අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා සූදානමින් තබාගත යුතුය.

08. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 500.00 කි. මෙම ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නිසි කොටුවෙහි එහි දාරයකින් අලවා ලදුපත් අංකය, දිනය හා තැපැල් කාර්යාලය සඳහන් කර තිබිය යුතුය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසාවත් ගාස්තු ආපසු ගෙවනු නොලබයි. විභාග ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, එවැනි අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(i) නිවැරදිව අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන දිනය දන්වමින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාගය ආරම්භ වන දිනයේ තම අත්සන සහතික කරගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍ර නොමැතිව ඔවුන්ට

විභාග ශාලාවට ඇතුළුවීමට හෝ විභාගයට පෙනී සිටිමට හෝ අවසර නොදෙනු ඇත.

(ii) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකේ.

(iii) සියලුම අපේක්ෂකයින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iv) විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දෙනු ලැබේ. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

(v) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ. :-

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

(vi) *විභාග ප්‍රතිඵල* :

නිවේදනයේ 03 ඡේදය අනුව ලිඛිත පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන්ගේ ලේඛනය ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. අදාළ කුසලතා ලකුණු ලැබීමෙන් අනතුරුව ලිඛිත පරීක්ෂණයේ හා කුසලතා ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව අනුව සකස් කළ අවසන් ප්‍රතිඵල ලේඛනය ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ දැනුම්දීම පරිදි විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව තැපැල් කිරීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීම සිදු කරනු ඇත.

10. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමෙහි සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාග ැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. (ෆැක්ස් අංකය - 011 - 2784232) එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එන්. එච්. එම්. චිත්‍රානන්ද,
ලේකම්,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

2021 ජූනි මස 04 වැනි දින,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,
නිල මැදුර, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**කුසලතා මත ග්‍රාම නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2021**
**Competitive Examination for the Promotion to Supra Grade of Grama Niladhari on Merit Basis - 2021**
(අංක 01 සිට 05 දක්වා මුල් පිටුවේ ද, අංක 06 සිට ඉදිරි පිටුවලට ද ඇතුළත් කළ යුතුය)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 2

දෙමළ -3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සේවය කරන දිස්ත්‍රික්කය :

(උපලේඛන - අංක 02 අනුව අදාළ දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න)

දිස්ත්‍රික් අංකය :

විභාගයට පෙනී සිටින නගරය :

| | |
|---|---|
| 1 | |
| 2 | |

නගර අංකය :

| | | |
|---|---|---|
| | | |
| | | |

(උපලේඛන - අංක 01 අනුව නගරය හා නගර අංකය ඇතුළත් කරන්න.)

**1 වන කොටස**
(*සැලකිය යුතුය* - ආකෘති පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුය.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (i) රාජකාරි ලිපිනය :————.

(ii) ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. (i) ස්ත්‍රී පුරුෂ භාවය :

0 - පුරුෂ (අදාළ කොටුව තුළ අංකය සඳහන් කරන්න)
1 - ස්ත්‍රී

(ii) උපන් දිනය :

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(iii) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(iv) දුරකතන අංකය : ජංගම :————. කාර්යාලයීය :————.

04. (i) සේවය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(ii) ග්‍රාම නිලධාරි වසම හා අංකය :

05. (i) දැනට දරන තනතුරට පත්වූ දිනය/අන්තර්ග්‍රහණය කළ දිනය හා ලිපියේ යොමු අංකය :————.

(ii) සේවා කාලය : අවුරුදු :————. මාස :————. දින :————.

06. ග්‍රාම නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරියෙකු නම් ඒ පිළිබඳ විස්තර :
(අදාල ඡේදය පමණක් සම්පූර්ණ කරන්න)

(i) විශේෂ සේවා නිලධාරි සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(ii) වගා නිලධාරි සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(iii) කෘෂි ව්‍යාප්ති සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.
(iv) ඊට සමාන වෙනත් සේවාවකට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.

07. ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක්ද, නැතිනම් නව ප්‍රවේශකයෙක් ද ? :————.

08. (i) සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක ඔබ උපයාගෙන තිබේද ? :————.

(ii) එසේ නැතිනම් විස්තර සඳහන් කරන්න. :————.

09. සංස්ථාවක හෝ වෙනත් සේවාවකට සේවය සඳහා ඔබ දැනට මුදාහැර ඇත්නම් ඒ පිළිබඳ විස්තර සපයන්න. :————.

10. ඔබ විදේශ රැකියාවක් සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් විස්තර දක්වන්න :————.

11. ඔබට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ ද? ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

***සැලකිය යුතුයි*** :- *ගැසට් පත්‍රයේ දක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල් කාර්යාලයෙන් ලබාගත්* කුවිතාන්සිය මෙහි නොගැලවෙනසේ ඇලවිය යුතුය.

| *ලදුපත නොගැලවෙනසේ එහි එක් දරයක් මගින් මෙහි අලවන්න.* |
|---|

කුවිතාන්සි අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.
මුදල : රුපියල් :————.

.................... වන මා විසින්, ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද, මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් මෙම සේවාවේ අධි ශ්‍රේණියට උසස්වීම පිළිබඳව වූ මගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දන්නා අතර, ඒ අනුව කටයුතු කිරීම ගැන මම විරුද්ධ නොවෙමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වෙමි.

————,
නිලධාරියාගේ අත්සන.

දිනය :————.

II වන කොටස

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතුය.

(i) .......................... මහතා/මහත්මිය/මෙනෙවිය ඉහත සපයා ඇති තොරතුරු, ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව සමග සසඳා බලන ලදුව ඒවා සත්‍ය හා නිවැරදි බවත්,
(ii) නියමිත විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අලවා ඇති බවත්,
(iii) ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්,
(iv) පූර්වාසන්න පස් වසර තුළ ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව පැවැති බවත් .......... දින සිට ග්‍රාම නිලධාරි 1 වන ශ්‍රේණියට පත් කරනු ලැබ ඇති බවත්, මේ සමග ඉදිරිපත් කර ඇති අයදුම්පතේ පිටපත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි අමුණන ලද බවත් සහතික කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්

නම :————,
පදවි නාමය :————,
නිල මුද්‍රාව :————.
දිනය :————.

(නොගැලපෙන වචන කපා හරින්න)

උපලේඛනය - අංක 01

විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන

මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර යන නගරවලදී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම්කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 001 |
| මහනුවර | 002 |
| ගාල්ල | 003 |
| යාපනය | 004 |
| මඩකලපුව | 005 |
| කුරුණෑගල | 006 |
| අනුරාධපුර | 007 |
| බදුල්ල | 008 |
| රත්නපුර | 009 |

ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර, ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයැදුම්කරුවන් යොමු කරනු ඇත.

තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

උපලේඛන අංක 02

**දිස්ත්‍රික් අංක ලැයිස්තුව**

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| 1 | කොළඹ | 01 |
| 2 | ගම්පහ | 02 |
| 3 | කළුතර | 03 |
| 4 | මහනුවර | 04 |
| 5 | මාතලේ | 05 |
| 6 | නුවරඑළිය | 06 |
| 7 | ගාල්ල | 07 |
| 8 | මාතර | 08 |
| 9 | හම්බන්තොට | 09 |
| 10 | යාපනය | 10 |
| 11 | මන්නාරම | 11 |
| 12 | වවුනියාව | 12 |
| 13 | මුලතිවු | 13 |
| 14 | කිලිනොච්චි | 14 |
| 15 | මඩකලපුව | 15 |
| 16 | අම්පාර | 16 |
| 17 | ත්‍රිකුණාමලය | 17 |
| 18 | කුරුණෑගල | 18 |
| 19 | පුත්තලම | 19 |
| 20 | අනුරාධපුරය | 20 |
| 21 | පොළොන්නරුව | 21 |
| 22 | බදුල්ල | 22 |
| 23 | මොණරාගල | 23 |
| 24 | රත්නපුර | 24 |
| 25 | කෑගල්ල | 25 |

**ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

ග්‍රාම නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2021

## Limited Competitive Examination for Promotion to Supra Grade of Grama Niladhari- 2021

2021 වර්ෂයට අදළව සීමිත පදනම මත ග්‍රාම නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම ගැසට් නිවේදනයේ 4 වන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ග්‍රාම නිලධාරි සේවයේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ විභාගය 2021 සැප්තැම්බර් මාසයේදී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර පවත්වනු ලබන මධ්‍යස්ථාන සහ මධ්‍යස්ථාන අංක සඳහන් ලැයිස්තුව, උපලේඛන අංක 01 වශයෙන් ද, දිස්ත්‍රික් අංක ලැයිස්තුව, උපලේඛන අංක 02 වශයෙන් ද, මෙම නිවේදනය අවසානයේ අමුණා ඇත.

01. *උසස් කිරීමේ ක්‍රමය* :

(i) සීමිත පදනම මත පුරප්පාඩු 48ක් පිරවිය යුතු අතර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පහත 04 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් විසින් පෙනී සිටිය යුතුය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක්/මණ්ඩල මගින් සුදුසුකම් පරීක්ෂා කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවීමේ දී ලිඛිත පරීක්ෂණය සමත් ලකුණු ප්‍රමාණය හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය අනුව සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛනයක් අනුව සීමිත තරග විභාගය මගින් බඳවාගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව හා එම පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% ක ප්‍රමාණය යන දෙකෙහි එකතුවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ii) අධි ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමේ දී පළමුව පවත්නා පුරප්පාඩු වලට ස්ථාන මාරුවීම් මගින් දැනට සිටින නිලධාරින්ට ස්ථාන මාරුවීමට අවස්ථාව ලබා දෙන අතර, එම ස්ථාන මාරු ලබා දීමෙන් පසු දිස්ත්‍රික්කය තුළ ඉතිරිවන පුරප්පාඩු වලින් 40% සඳහා විභාගයේදී ලබන ජ්‍යෙෂ්ඨත්වය මත සේවයේ සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බැහැර, දිස්ත්‍රික්කය තුළ වෙනත් කොට්ඨාසයකට අනුයුක්ත කරන අතර, දිස්ත්‍රික්කය තුළ පවත්නා එම පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක් සුදුසුකම් ලබා ඇති අවස්ථාවන්හි දී, එම අය දිස්ත්‍රික්කයෙන් පිටත පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කරනු ඇත. එසේ අනුයුක්ත කරනු ලබන ස්ථානවල පත්වීම් බාර නොගන්නා අයගේ පත්වීම් අවලංගු කරන අතර, එවැනි අයකුට පසු අවස්ථාවක දී එම පත්වීම් සඳහා මෙම විභාගයේ ප්‍රතිඵල මත නැවත ඉල්ලීමක් කිරීමට හිමිකම් නොලබනු ඇත.

02. *විභාග පටිපාටිය*.-අයදුම්කරුවන් පහත සඳහන් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පවත්වනු ලබන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් වන අතර, ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. :

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 1. කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රම | 01 | ලකුණු 100 | පැය 01 1/2 යි |
| 2. ආයතන කාර්ය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 02 | ලකුණු 100 | පැය 01 1/2යි |
| 3. විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම | 03 | ලකුණු 100 | පැය 01 1/2 යි |
| 4. පොදු ප්‍රශ්න පත්‍රය | 04 | ලකුණු 100 | පැය 01 1/2යි |

විභාගයේ දී අවම සුදුසුකම් ලැබීම සඳහා සෑම විෂයයක් සඳහා අවම ලකුණු 40ක් ලබාගත යුතු වේ.

03. *විෂය නිර්දේශය* :

(i) කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රම (විෂය අංකය 01) :

කාර්යාල කළමනාකරණයට අදාළව සංවිධාන ව්‍යුහය, සංවිධාන පිළිබඳ මූලධර්ම, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයුම්, නායකත්වය අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය, මහජන සම්බන්ධතා සම්බන්ධීකරණය හා ගැටලු නිරාකරණය ආශ්‍රිතව පිළිතුරු සැපයිය යුතු අතර, කාර්යාල ක්‍රම සඳහා කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය හා ආකෘති පත්‍ර සැළසුම් කිරීම, ලිපි ගනුදෙනු කිරීම, කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ පාලනය, කාර්යාලයේ සැළැස්ම හා වටපිටාව, රැකියා පිළිබඳ විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, වැඩ පියවර සකස් කිරීම යන අංශ ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

(ii) ආයතන කාර්ය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (විෂය අංකය 02) :

ආයතන කාර්ය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති කොටසට අදාලව රාජ්‍ය සේවයට

බඳවා ගැනීමේ දී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා සේවය අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, රාජ්‍ය සේවක විනය, සුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳ රජය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති හා ඉදිරියේදී නිකුත් කරනු ලබන රෙගුලාසි, කාර්ය පටිපාටි හා චක්‍රලේඛ පිළිබඳ සාමාන්‍ය අවබෝධය ආශ්‍රිත ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු අතර, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා වාර්ෂික ඇස්තමේන්තු හා ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීම්, මුදල් පාලනය, මූල්‍ය වගකීම් පැවරීම, මුදල් බාර ගැනීම, ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවාවන්, ටෙන්ඩර් කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිතාවන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම් හා මූල්‍ය පාලන පොත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ රජය විසින් මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි සහ චක්‍රලේඛ පිළිබඳ සාමාන්‍ය අවබෝධය යන අංශ ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

(iii) විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම - (විෂය අංකය 03) :

ග්‍රාම නිලධාරීන්ට විවිධ අණපනත්, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් ව්‍යවස්ථාපිත රජයේ ආයතන මගින් පැවරී ඇති රාජකාරි විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන අතර, එම පැවරී ඇති විෂයයන්ට අදාළ සිද්ධි අධ්‍යයනයක් ඇතුළත් වේ.

(iv) පොදු ප්‍රශ්න පත්‍රය (විෂය අංකය 04) :

රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්ති හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාර ධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාල භෞතික පරිසරය නිර්මාණය කිරීම, කාර්ය මණ්ඩලයේ සුභසාධක කටයුතු, නිල තත්ත්වය හා සිවිල් තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක පිළිගැනීම්, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් අපේක්ෂා කෙරේ.

04. *සුදුසුකම්.*- අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයට අපේක්ෂකයින් පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.:-

*වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :*

(i) ග්‍රාම නිලධාරී I වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම ;

හෝ

(ii) නියමිත දිනට අවම වශයෙන් ග්‍රාම නිලධාරි II ශ්‍රේණියේ වසර 08 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ ග්‍රාම නිලධාරි II වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම ;

හෝ

(iii) අවම වශයෙන් ග්‍රාම නිලධාරි II වන ශ්‍රේණියේ අවුරුදු 05 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති උපාධිධාරියෙකු වීම;

*වෙනත් :*

(i) II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

(ii) පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව ගණනය කරනු ලැබේ.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සටහන :*

(i) 2010.09.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ග්‍රාම නිලධාරි බඳවා ගැනීමේ පටිපාටියේ 14.1 හි II වගන්තිය යටතේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලදුව, එම බඳවා ගැනීමේ පටිපාටියෙහි 10. 1.1 වගන්තියේ විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරන ලද නිලධරයන්ගේ පූර්ව II ශ්‍රේණියේ සේවා කාලය ද නියමිත සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

05. *වැටුප් ක්‍රමය :*

(i) වැටුප් කේත අංකය - MN7 - 2016 (රු.41,580 - 11 x 755- 18 x 1,030 - රු. 68,425) - 2 වැනි පියවර.

(මෙම වැටුප් පරිමාණය අනුව වැටුප් සකස් කිරීමේ දී 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අදාළ වේ.)

06. *අයදුම්පත් බාර ගැනීම :*

- මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. අයදුම්පත් A4 කඩදාසියක දෙපැත්ත භාවිතයට ගනිමින් පිළියෙල කර ගත යුතු ය. අංක 01 සිට 05 දක්වා එහි මුල් පිටුවේ ද, ඉතිරි කොටස් ඉදිරි පිටුවල ද සකස් කළ යුතු ය. අයදුම්පත් පරිගණකයක ආධාරයෙන්

පිළියෙල කරගත හැකි නමුදු අයදුම්කරුවන්ගේම අත් අකුරින් මෙහි දැක්වෙන උපදෙස් පරිදි නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය.

- අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.
- අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කළ යුතු ය. එක් පිටපතක් තමාගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ද, මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ද එවිය යුතු ය.
- සියලුම විභාග අපේක්ෂකයින් තම අයදුම්පත් තමා සේවය කරන වසම අයත් ප්‍රාදේශීය ලේකම් මගින්, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන ආයතනික විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2021 ජූලි මස 12 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය.
- අයදුම්පත්‍ර එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ ''ග්‍රාම නිලධාරි සේවාවේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2021'' යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.
- අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතු ය. එතෙකුදු වුවත් තමන් සඳහන් කරන, එමෙන්ම තමන්ගේ සුදුසුකම් සනාථ කරන ලියවිලි ඉල්ලූ අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා සූදානමින් තබාගත යුතු ය.

07. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 500 කි. මෙම ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත කොටුවෙහි එහි දාරයකින් අලවා ලදුපත් අංකය, දිනය හා තැපැල් කාර්යාලය සඳහන් කර තිබිය යුතු ය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසාවත් ගාස්තු ආපසු ගෙවනු නොලබයි. විභාග ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, එවැනි අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.

(i) *විභාගයට ඇතුළත් කර ගැනීම* :

- නිවැරදිව අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන දිනය දන්වමින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශපත්‍ර නොමැතිව ඔවුන්ට විභාග ශාලාවට ඇතුලුවීමට හෝ විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.
- විභාගයට ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත, තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.
- සියලුම විභාග අපේක්ෂකයින් රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද විභාග නීතිරීති පිළිබඳව අවබෝධයක් ලබා සිටිය යුතු අතර, ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතු ය.
- විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි නිවාඩු දෙනු ලැබේ.
- විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් කුමක් වුවත් භාරගනු ලැබේ. :-

  i. ජාතික හැඳුනුම්පත,
  ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
  iii. වලංගු රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

(ii) *විභාග ප්‍රතිඵල* :

මෙම නිවේදනයේ 02 ඡේදයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව අනුව සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛනයක් අනුව සීමිත තරග විභාගය මගින් බඳවාගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව හා එම පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% ක ප්‍රමාණය යන දෙකෙහි එකතුවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇතුළත් ලේඛනයක් ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පලකරනු ඇත.

09. (i) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමෙහි සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. (ෆැක්ස් අංකය - 011 - 2784232) එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

10. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පිළිපැදීමට අපේක්ෂකයින් යටත් වේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එන් එච්. එම් චිත්‍රානන්ද,
ලේකම්,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

2021 ජූනි මස 04 වැනි දින,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,
නිල මැදුර,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

ග්‍රාම නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2021

**Limited Competitive Examination for Promotion to Supra Grade of Grama Niladhari - 2021**

(අංක 01 සිට 05 දක්වා මුල් පිටුවේද, අංක 06 සිට ඉදිරි පිටුවලටද ඇතුලත් කළ යුතුය.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය

| |
|---|
| |

සිංහල - 2

දෙමළ - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| |
|---|
| |

සේවය කරන දිස්ත්‍රික්කය

| | |
|---|---|
| | |

දිස්ත්‍රික් අංකය

(උපලේඛන - අංක 02 අනුව අදාළ දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න.)

*විභාගයට පෙනී සිටින නගරය*

| | |
|---|---|
| 1 | |
| 2 | |

*නගර අංකය*

| | | |
|---|---|---|
| | | |
| | | |

(උපලේඛන - අංක 01 අනුව නගරය හා නගර අංකය ඇතුළත් කරන්න.)

1 වන කොටස
(*සැළකිය යුතුය* - ආකෘති පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුය.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (i) රාජකාරි ලිපිනය :————.

(ii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. (i) ස්ත්‍රී පුරුෂ භාවය : [ ]

පුරුෂ - 0 (අදාළ කොටුව තුළ අංකය සඳහන් කරන්න)
ස්ත්‍රී - 1

(ii) උපන් දිනය :

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(iii) ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

(iv) දුරකථන අංකය : ජංගම :————. කාර්යාලයීය :————.

04. (i) සේවය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(ii) ග්‍රාම නිලධාරි වසම :————. අංකය : [ | | ]

05. (i) දැනට දරන තනතුරට පත්වූ දිනය/අන්තර්ග්‍රහණය කළ දිනය හා ලිපියේ යොමු අංකය :

(ii) මුළු සේවා කාලය : අවුරුදු :————. මාස :————. දින :————.

(iii) දැනට සිටින ශ්‍රේණිය :————.
එම ශ්‍රේණියේ සේවා කාලය : අවුරුදු :————. මාස :————. දින :————.

06. ග්‍රාම නිලධාරි සේවයට අන්තර්ග්‍රහනය කරන ලද නිලධාරියෙකු නම් ඒ පිළිබඳ විස්තර :
(අදාළ ඡේදය පමණක් සම්පූර්ණ කරන්න)

(i) විශේෂ සේවා නිලධාරි සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.

(ii) වගා නිලධාරි සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.

(iii) කෘෂි ව්‍යාප්ති සේවයට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.

(iv) ඊට සමාන වෙනත් සේවාවකට ඇතුළත් වූ දිනය :————.
සේවා කාලය :————.

07. ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක්ද, නැතිනම් නව ප්‍රවේශකයෙක් ද ? :————.

08. (i) සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක ඔබ උපයාගෙන තිබේද ? :————.

(ii) එසේ නැතිනම් විස්තර සඳහන් කරන්න. :————.

09. සංස්ථාවක හෝ වෙනත් සේවාවකට සේවය සඳහා ඔබ දූනට මුදාහැර ඇත්නම් ඒ පිළිබඳ විස්තර සපයන්න. :————.

10. ඔබ විදේශ රැකියාවක් සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් විස්තර දක්වන්න :————.

11. ඔබට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ ද? ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

***සැළකිය යුතුයි*** :- *ගැසට් පත්‍රයේ* දක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙනසේ ඇලවිය යුතුය.

| ලදුපත නොගැලවෙනසේ එහි එක් දරයකින් මෙහි අලවන්න. |
|---|

කුවිතාන්සි අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.
මුදල : රුපියල් :————.

.................... වන මා විසින්, ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද, මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මෙම සේවාවේ අධි ශ්‍රේණියට උසස්වීම පිළිබඳව වූ මගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දන්නා අතර, ඒ අනුව කටයුතු කිරීම ගැන මම විරුද්ධ නොවෙමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වෙමි.

————,
නිලධාරියාගේ අත්සන.

දිනය :————.

II වන කොටස

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතුය.

(i) .......................... මහතා/මහත්මිය/මෙනෙවිය ඉහත සපයා ඇති තොරතුරු, ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව සමග සසඳා බලන ලදුව ඒවා සත්‍ය හා නිවැරදි බවත්,

(ii) නියමිත විභාග ගාස්තු ගෙවා, එම ලදුපත අලවා ඇති බවත්,

(iii) ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්,

(iv) පූර්වාසන්න පස් වසර තුළ ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව පැවැති බවත් .......... දින සිට ග්‍රාම නිලධාරී .......... වන ශ්‍රේණියට පත් කරනු ලැබ ඇති බවත්, මෙම ඉල්ලුම්පතේ පිටපත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි අමුණන ලද බවත් සහතික කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්.

නම :————,
පදවි නාමය :————,
නිල මුද්‍රාව :————.
දිනය :————.

(නොගැලපෙන වචන කපා හරින්න)

උපලේඛනය - අංක 01

විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන

මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර යන නගරවලදී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම්කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 001 |
| මහනුවර | 002 |
| ගාල්ල | 003 |
| යාපනය | 004 |
| මඩකලපුව | 005 |
| කුරුණෑගල | 006 |
| අනුරාධපුර | 007 |
| බදුල්ල | 008 |
| රත්නපුර | 009 |

ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර, ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කරනු ඇත.

තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

උපලේඛන අංක 02

දිස්ත්‍රික් අංක ලැයිස්තුව

| *අංකය* | *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංකය* |
|---|---|---|
| 1 | කොළඹ | 01 |
| 2 | ගම්පහ | 02 |
| 3 | කළුතර | 03 |
| 4 | මහනුවර | 04 |
| 5 | මාතලේ | 05 |
| 6 | නුවරඑළිය | 06 |
| 7 | ගාල්ල | 07 |
| 8 | මාතර | 08 |
| 9 | හම්බන්තොට | 09 |
| 10 | යාපනය | 10 |
| 11 | මන්නාරම | 11 |
| 12 | වවුනියාව | 12 |
| 13 | මුලතිවු | 13 |
| 14 | කිලිනොච්චි | 14 |
| 15 | මඩකලපුව | 15 |
| 16 | අම්පාර | 16 |
| 17 | ත්‍රිකුණාමලය | 17 |
| 18 | කුරුණෑගල | 18 |
| 19 | පුත්තලම | 19 |
| 20 | අනුරාධපුරය | 20 |
| 21 | පොළොන්නරුව | 21 |
| 22 | බදුල්ල | 22 |
| 23 | මොණරාගල | 23 |
| 24 | රත්නපුර | 24 |
| 25 | කෑගල්ල | 25 |

06-241/2

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2021

1. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහාවූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පහත සඳහන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් උපාධිය ලබා ඇති පහත සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :

| *සංකේත අංකය* | *අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව* | *සම්පූර්ණ කළ යුතු උපාධිය* |
|---|---|---|
| 1. | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | වෛද්‍ය රසායනාගාරවේදී (B.Sc. MLS ) |
| 2. | ඖෂධවේදී | ඖෂධවේදී (B.Pharm)<br>විද්‍යාවේදී (ඖෂධවේදී) (B.Sc.Pharmacy ) |
| 3. | විකිරණ ශිල්පී | විකිරණ ප්‍රතිකාරවේදී (B.Sc. Radio therapy)<br>විකිරණ විද්‍යාවේදී (B.Sc. Radio graphy) |
| 4. | භෞත චිකිත්සක | භෞත චිකිත්සකවේදී (Bachelor in Physiotherapy)<br>විද්‍යාවේදී (භෞත චිකිත්සක) ( B.Sc. Physiotherapy) |
| 5. | වෘත්තීය චිකිත්සක | වෘත්තීය චිකිත්සකවේදී (Bachelor in Occupational Therapy )<br>විද්‍යාවේදී (වෘත්තීය චිකිත්සක) (B.Sc. in Occupational Therapy) |

(*සැලකිය යුතුයි* - අයදුම්කරුවන් විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම්, උක්ත එක් එක් තනතුරට අදළව ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.)

3. අනෙකුත් පොදු සුදුසුකම් :

(*අ*) 2021.06.25 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.
(*ආ*) අදළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතුය.
(*ඇ*) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් සමන්විත විය යුතුය.

4. අයදුම් කළ යුතු ක්‍රමය :

(*අ*) A4 ප්‍රමාණයේ කඩදසි භාවිත කර මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව (අංක 1 සිට 9 දක්වා පළමු පිටුවේද, 10 සිට 13 දක්වා දෙවන පිටුවේ ද) වන සේ අයදුම්පත සකස් කරගත යුතුය.

(*ආ*) අයදුම්පතේ ''ලදුපත'' ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන ''සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විභාග ගාස්තු රැස්කිරීම'' යන ගිණුමට රු. 500 බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබාගන්න)

(*ඇ*) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතීඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 393,684ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ ''පරිපූරක වෛද්‍ය සේවාවන් හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් ලෙස උපාධිධාරීන් බඳවා ගැනීම - 2021'' වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර 2021.06.25 දිනට පෙර අධ්‍යක්ෂ (පරිපාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

6. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. එක් එක් පුහුණු පාඨමාලාවන්ට අදාළව ඉහතින් දක්වා ඇති උපාධිධාරීන්ගේ උපාධිය බලපවත්වන දිනය (Effective Date) හා උපාධියේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) පදනම් කරගෙන කුසලතා ලේඛන සකස් කර එක් එක් පුහුණු පාඨමාලාවන්ට සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව මීට පෙර නිකුත් කර ඇති *ගැසට්* නිවේදනයේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වූ 2019.06.14 දිනට පසුව උපාධිය ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

8. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා උපාධිධාරීන් අයදුම් කර තිබේනම් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය පිළිබඳ පැය 01ක ප්‍රශ්න පත්‍රයකින් යුත් ලිඛිත විභාගයක් පවත්වා එම විභාගයේ දී දක්වන කුසලතාවය අනුව වෙන් කළ හැකි පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණුවට බඳවා ගැනීම සිදුකෙරේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය,
(2) උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතුය,
(3) අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත,
(4) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය,
(5) තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2021.06.25 දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය. (පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතික (ග්‍රාම නිලධාරි සහතිකය- DS4)

9. පුහුණු කිරීමේ පරිපාටිය :

(i) සම්මුඛ පරීක්ෂණයට ලක්කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට මාස 06 කාලයක් සඳහා පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ.

(ii) පුහුණු පාසල්වල ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන චෙතත් නියෝගවලට ද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේදී පුහුණුව සාර්ථකව නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදයක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකිය.

(iv) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළදී අභ්‍යාසලාභීන් 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව දීමනා ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතුය. පුහුණු කාල සීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් හෝ ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ (05)

කාලපරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදල මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතුය. එසේ නොමැති වුහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :

පුහුණුව අවසානයේ අදළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදනය කිරීම සිදුකරන/නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු මත අදල තනතුරේ III වන පන්තියේ තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ. උක්ත සංකේත අංක 1, 2, 3, 4, 5 ලෙසින් වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT-6-2016 හි පරිදි රු. 32,080 - 445 x 10 - 660 x 11 - 730 x 10 - 750 x 10 - රු. 58,590 යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

11. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන දීමනාව, රජය විසින් දරන වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවීමේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරීන්ට අදළවන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

14. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටියි. ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

15. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උද්වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 ජුනි මස 05 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත

| පුහුණු පාඨමාලාවන්ට අදාළ සංකේත අංකය (ගැසට් නිවේදනයට අනුව) |
|---|
| |

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2021**

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න)

අයදුම්කරන පාඨමාලාව (සිංහලෙන්/දෙමළෙන්) :————.

අයදුම්කරන පාඨමාලාව (ඉංග්‍රීසියෙන්) :————.

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
   (ඉංග්‍රීසියෙන් කැපිටල් අකුරෙන්) උදා. A. B. C. SILVA
   (ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
   (ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :————. (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ..................... | ..................... |
| | ..................... | ..................... |
| | ..................... | ..................... |
| | ..................... | ..................... |

4. (අ) ස්ථිර ලිපිනය :

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ..................... | ..................... |
| | ..................... | ..................... |
| | ..................... | ..................... |
| | ..................... | ..................... |

   (ආ) දුරකථන අංකය : ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

   ස්ථිර ☐☐☐☐☐☐☐☐☐☐

   (ඇ) පදිංචි දිස්ත්‍රික්කය : සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

   (ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :————.

   (ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :————.

5. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

   2021.06.25 දිනට වයස අවුරුදු :————. මාස :————. දින :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග : ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න)

8. විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

9. අධ්‍යාපන සුදුසුකම් :

| අනු අංකය | සමත් වූ උපාධිය | සාමාර්ථය | ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) හා උපාධිය බල පවත්වන දිනය | විශ්වවිද්‍යාලය | අධ්‍යන වර්ෂය | ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍ය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ ලකුණ යොදන්න.)

''ඔව්'' නම් විස්තර සපයන්න. :.............................................

11. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් පූර්ණකාලීන පාඨමාලාවට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සෙකු වන බව පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බවද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞ. සේ. අ. ජ. විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලික දන්නා හඳුනන බවද, ඔහු/ඇය ............ දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

13. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න.)

(i) ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන .................................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ .............. තනතුර දරන බව මින් සහතික කරමි.

(ii) ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව

06-246

---

**සංශෝධනයයි**

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020 (2021)**

අංක 2,230 දරන 2021.05.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020(2021) විභාග නිවේදනය හා බැඳේ.

02. එම නිවේදනයෙහි 9.1 ඡේදයෙහි සඳහන් අයදුම්පත් කැඳවන අවසන් දිනය 2021.07.19 දින දක්වා දීර්ඝ කරන අතර, **එහි 6 ඡේදයෙහි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය 2021.06.28 ලෙස නොවෙනස්ව පවතී.**

03. තවද, මෙම විභාගය සඳහා මාර්ගගත ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. ඒ සඳහා www.doenets.lk යන වෙබ් අඩවියෙහි අවශ්‍ය උපදෙස් පළ කර ඇති අතර, එම වෙබ් අඩවියට පිවිස එහි සඳහන් උපදෙස් අනුව අයදුම් කිරීමට කටයුතු කරන්න.

04. මෙම විභාගය සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින ලෙස දැනුම් දෙනු ලැබේ.

එන්. එච්. එම්. චිත්‍රානන්ද,
ලේකම්,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

2021 ජුනි මස 04 වැනි දින,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,
''නිල මැදුර'', ඇල්විටිගල මාවත,
කොළඹ 05.

06-240

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල /දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021 සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

02. *සේවා කොන්දේසි :*

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට සහ ඊට කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 සහ ඊට කරනු ලබන සංශෝධනයන් හි සඳහන් පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ මට්ටම අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. *වැටුප :* අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය (MN 2-2016) රු.28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු.47,990 (ආරම්භක වැටුප - රු.28,940) ක් වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. *සුදුසුකම් :*

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල /දෙමළ) (සිංහල/ඉංග්‍රීසි)(දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(I) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය යන විෂයයන් අතරින් විෂයයන් දෙකකට (02) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(II) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එක්වර සමත්ව තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03)කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

(III) වෙනත් ජාත්‍යන්තර භාෂා පිළිබඳ දැනීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

*සැ.යු.* - සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2021.07.12 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *විභාග පටිපාටිය* :
විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|
| 01 භාෂා හැකියාව | 100 | 40 |
| 02 අභියෝග්‍යතාවය | 100 | 40 |
| 03 පරිවර්තනය | 100 | * |

(*පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන පරිවර්තන විෂයයේ සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

- ❖ මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.
- ❖ අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා " අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.
- ❖ පරිවර්තනය සඳහා තමන් අයදුම් කරන ශ්‍රේණියට අදාළ ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය. රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

*විභාගය සඳහාවන විෂය නිර්දේශය* :

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 03 | පරිවර්තනය | සිංහල/ඉංග්‍රීසි භාෂාවට<br>ඉංග්‍රීසි/සිංහල භාෂාවට |
| | | සිංහල/දෙමළ භාෂාවට<br>දෙමළ/සිංහල භාෂාවට |
| | | දෙමළ/ඉංග්‍රීසි භාෂාවට<br>ඉංග්‍රීසි/දෙමළ භාෂාවට |

*සටහන.*- සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම අපහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කල පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

*විභාග ප්‍රතිඵල.*- අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් තැපෑලෙන් සිදු කරනු ඇත.

08. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම

හෙළිදරව් වුයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. *විභාග ගාස්තු.*-විභාග ගාස්තු රු. 400 කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(*අ*) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½'' x 12'' (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයඳුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2021 ජූලි මස 12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල /දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. 2021 ජූලි මස 12 ට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(*ඇ*) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(*ඈ*) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(*ඉ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. *විභාගයට පෙනී සිටීම.*- ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මගින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරන ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*-තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

13. *විභාගයට ඇතුළත් වීම :*

(*අ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම

ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාල ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන*.- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2021 ජුනි මස 07 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල /දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 1
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. අයදුම්කරන භාෂණ පරිවර්තක තනතුර :

සිංහල/දෙමළ
සිංහල/ඉංග්‍රීසි
දෙමළ/ඉංග්‍රීසි
(අදාළ අංකය කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

03. පෞද්ගලික තොරතුරු :

3.1 මුලකුරු සමග නම :Mr/Mrs/Miss ————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) *උදා* : A.P.K. SIRIWARDANA

3.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

3.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

3.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :————.

3.5 පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :————.

3.6 පදිංචි දිස්ත්‍රික්කය :————.

3.7 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.8 උපන් දිනය :————.

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.9 2021.07.12 දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.12 දුරකථන අංකය :
ස්ථාවර :————. ජංගම :————. ෆැක්ස් :————.

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(1) විභාගයේ වර්ෂය හා මාසය :————.

(2) විභාග අංකය :————.

(3) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තරː

(1) විභාගයේ වර්ෂය හා මාසය :————.

(2) විභාග අංකය :————.

(3) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

4.3 වෙනත් ජාත්‍යන්තර භාෂා දැනීම සම්බන්ධයෙන් ඇති සුදුසුකම් :

| *ජාත්‍යන්තර භාෂාව* | *සුදුසුකම* | *සුදුසුකම ලබාගත් ආයතනය* |
|---|---|---|
| | | |
| | | |

05. වෙනත් සුදුසුකම් : ..............................................................................................
..............................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐ ......................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
විභාග ගාස්තු ගෙවූ බැංකුව :————.
ලදුපත් අංකය හා දිනය :————.
ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

08. අයදුම්කරුගේ සහතිකය :
(*අ*) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇතිවන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.
(*ඇ*) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.
(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන ........................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී....................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක (සිංහල/දෙමළ) (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට 2021.07.12 දිනට වයස අවුරුදු 32 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :————.
නිල මුද්‍රාව :————.

06-244

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.